## මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2022.02.11දින පැවති මහා සභාවේ වාර්තාවයි.

2022.02.11 වන දින පෙ.ව.9.30 ට පමණ ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිතුමියගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු ආරම්භ කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
අද දින සභා රැස්වීමට පැමිණ සිටින ඔබ සියලුම දෙනා ඉතාමත් ආදරයෙන් පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව අද දින සභා කටයුතු ආරම්භ කරමු. අනතුරුව පසුගිය සභාවේ වාර්තාව සභා අනුමැතිය සදහා ඉදිරිපත් කරමි.

**ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)**
2022.01.12 දිනැති සභා වාර්තාව නිවැරැදි බවට මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
එම යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
කොවිඩ් 19 වසංගතය සදහා මෙතෙක් එන්නත ලබා නොගත් අය එන්නත ලබා ගැනීමට ගරු මන්ත්‍රීවරුන් මගින් දැනුවත් කිරීම් කරන ලෙසට පසුගිය 29 වන දින මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් උපදෙස් ලබා දී තිබුණා. ඒ අනුව තමන්ගේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ මෙතෙක් තුන්වන කොවිඩ් මාත්‍රාව ලබා නොගත් ජනතාවට එය ලබා ගැනීමට දැනුම් දෙන ලෙසට ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි. ඊළඟට සභාවට ලැබුණු ලිපි සහ පැමිණිලි ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**ලිපි අංක 01**
**යොමුව** - ගරු උප සභාපති පී.පි.ප්‍රදීපන් මැතිතුමා
**විෂය**- 2022.02.11 වන දින සභා රැස්වීම සදහා පැමිණීමට නොහැකි බව දන්වන නිවාඩු ඉල්ලුම් ලිපිය

**තීරණ අංක 01**
ගරු උප සභාපතිතුමාගේ නිවාඩුව සදහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**ලිපි අංක 02**
**යොමුව** - ගරු උප සභාපති පී.පි.ප්‍රදීපන් මැතිතුමා
**විෂය**- 2022 වර්ෂය සදහා කමිටු නම් කිරීම පිළිබඳ ලිපිය

**ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)**
පසුගිය සභා වාරයේදී 2022 වර්ෂය සදහා වු නව කමිටු සාමාජිකයින් පත්කළා. එම අවස්ථාවේදී තමාගේ පෞද්ගලික හේතු නිසා ඔහුව කිසිම කමිටුවකට සම්බන්ධ කර නොගන්නා ලෙසට ගරු උප සභාපතිතුමා පවසලා තිබුණා. ඒ වගේම 2022 වර්ෂය සදහා වරිපනම් බදු අය කිරීමට පවා ඔහු විරුද්ධ වුණා. නැවතත් එතුමා ලිපි යොමු කරලා තියෙන එකට එකඟ වෙන්න බැහැ. මේ සදහා මා විරෝධය පල කරමි. සභාවේ දී එක්තරා විදියකට අදහස් පල කරලා ලිපියේ වෙනත් විදිහකට ලියලා තියෙනවා.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

ගරු උප සභාපතිතුමා කමිටුවලට සම්බන්ධ විය යුතු නම්, පසුගිය සභා වාරයේදී සභාව පක්ෂ, පාට, ජාති භේද මත කටයුතු කරනවා කියලා ප්‍රකාශ කළ එක ඔහු ඉල්ලා අස් කර ගත යුතුයි. තවද පසුගිය සභා වාරයේදී සිදුවූ සියලු දේවල් නිවැරැදි බවට ඔහු මෙම සභාවට ප්‍රකාශ කළ යුතුයි. ඉන්පසුව එතුමාව කමිටුවලට සම්බන්ධ කිරීම පිළිබඳව සලකා බැලිය හැකියි. මාධ්‍යවලට එක විදිහකටයි ලිපියේ වෙනත් විදිහකටයි කරුණු ඉදිරිපත් කරනවා. මේවා පිළිගන්න එක සභාවට අපහාස කරන බවටයි අපට පෙනී යන්නේ. මෙම මාධ්‍ය ඉදිරියේදී සභාවේ සියලු කටයුතු සම්බන්ධව සහයෝගය ලබා දෙන බවට සහ වැරදි දේවල් සිදු නොවූ බවට ඔහු පිළිගත යුතුයි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු සභාපතිතුමියනි, ගරු උප සභාපතිතුමා කී වතාවක් සභාවට පැමිණිලා තියෙනවද? කී වතාවක් ඔබතුමියගේ වැඩ කොටස් බාරගෙන තියෙනවද? රාජකාරී වෙන් කර පවරන්නේ නැතිව එතුමා කොහොමද සභාවට එන්නෙ කියලා අහනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**

මම රට ගිහිල්ලා සිටි අවස්ථාවේ එතුමා වැඩ බලන තනතුරේ කටයුතු කරලා තිබුණා. සභාපති ඉන්න අවස්ථාවේ කොහොමද රාජකාරී පවරලා දෙන්නේ?.

**<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)</u>**

පසුගිය සභා වාරයේදී අපි සියලුම කාර්යයන් අවසන් කළා. ඒ අවස්ථාවේදි කිසිම කාර්යයකට සහයෝගය ලබා නොදී දැන් කමිටුවට සම්බන්ධ වීම සදහා ලිපි යොමු කිරීම පිළිගන්න බැහැ. එදා මුදල් කමිටු සාකච්ඡාවේ දී වුවද ඔබතුමිය හදිසි රැස්වීමකට සහභාගී වීම සදහා පිටත්වෙන අවස්ථාවේදී ගරු මන්ත්‍රී දිසානායක මැතිතුමාව එම කමිටුවේ සභාපති වශයෙන් නම් කරලා ගියා. එදින ගරු උප සභාපතිතුමා කමිටුවේ හිටියෙ නැහැ නේද? එතුමා එදින කමිටුවේ හිටියා නම් සභාපති වශයෙන් නම් කරන්න තිබුණා නේද?

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු උප සභාපතිතුමා එම කමිටුවට සුදුසු නැති පුද්ගලයෙක්. එතුමා එවල තියෙන ලිපිය කමිටුවේ සිටින ගරු එස්.සුරේෂ්කුමාර් සහ කේ.නිත්‍යානන්දන් වැනි මන්ත්‍රීවරුන් ප්‍රතික්ෂේප කරනවා. එනිසා දැනට පවතින කමිටුවේ සාමාජිකයින් සමග ක්‍රියාත්මක කරන්න.

| **තීරණ අංක 02** |
| --- |
| ගරු උප සභාපතිතුමා සභා රැස්වීමකට පැමිණෙන දිනයකදී මෙම ලිපිය පිළිබඳව කටයුතු කිරීමට තීරණය කරන ලදී. |

**ලිපි අංක 03**

**යොමුව** - ප්‍රාදේශීය රෝහල, මස්කෙළිය

**විෂය** - රෝහල් පරිශ්‍රය පවිත්‍ර කර දීම පිළිබඳව ස්තූතිය පල කිරීමේ ලිපිය

**ලිපි අංක 04**
**යොමුව** - ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන සම්මේලනය
**විෂය** - පළාත් පාලන ආයතන වල කාන්තාවන්ගේ දේශපාලන නියෝජන අගය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය පිළිබඳ ලිපිය

**ලිපි අංක 05**
**යොමුව** - ආදායම් පරීක්ෂක, මස්කෙළිය ප්‍රාදේශීය සභාව
**විෂය** - 2021 වර්ෂයේ කොවිඩ් 19 වසංගතය හේතු කොටගෙන ටෙන්ඩර්කරුවන් සදහා සහන ලබා දීම පිළිබඳ ලිපිය

**<u>ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)</u>**
කොවිඩ් වසංගතය හේතුවෙන් ටෙන්ඩර්කරුවන්ට වන අසාධාරණය සම්බන්ධව ලබාදෙන සහන පිළිබඳ ලිපියේ සදහන් වන පරිදි දින ගණන අනුව එකොලොස් ලක්ෂ අසූ අට දහස් ගණනක් සභාවෙන් ඒ අයට ගෙවන්න වෙනවා. අපට අහිමි වෙනවා.10% ක් ලබා දුන්නොත් හාර ලක්ෂ ගාණක් වෙනවා. ඒ අයගේ සාධාරණයත් සමග සේවා කාලය, වන්දනා කාලය පැමිණීමත් සමග විමසා බැලුවොත් හාර ලක්ෂ හැත්තෑදහස් ගණනත් එක්ක ගියොත් සභාවටත් ආදායමක් ඇතැයි කියන විශ්වාසය මගේ ලග තියෙනවා. එනිසා ඒ වගේ සාමාන්‍ය මුදලකට යන්න පුළුවන් නම් හොඳයි. මන් හිතන්නේ පසුගිය 2022 සමයේ හතරවෙනි මාසෙ 20 තමයි රටේ අඟුළු දැමීම සිදු කළේ. එතෙක් වන්දනා සමය හා වෙනත් දේවල් කරගෙන ගියා. එනිසා ලොකු සහනයකට නොයා සාමාන්‍ය සහනයකට යන්න ඕන කියන එකයි මගේ අදහස.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
10% ක සහනයක් ලබා දෙන්නේ නම් දෙපාර්ශවයටම සහනයක් සිදු වේවි.

**තීරණ අංක 03**
කොවිඩ් 19 වසංගතය හේතුවෙන් 2021 වර්ෂයේ දී ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් මුදලින් 10% ක සහනයක් ලබාදීමට සභාවෙන් ඒකමතිකව තීරණය කරන ලදී.

**ලිපි අංක 06**
**යොමුව** - පළාත් පාලන දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත
**විෂය**- පළාත් පාලන ආයතන වල නිල කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් වූ ගැසට් නිවේදනය පිළිබඳ ලිපිය

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ඒ සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ හැඳුනුම්පත අලුත් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ලිපි අංක 07**
**යොමුව -** විෂය ලිපිකරු
**විෂය -** කොම්පෝස්ට් බඳුන් ලබාදීම පිළිබඳ ලිපිය

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

විශේෂයෙන්ම පළාත් සභාව මගින් ක්‍රියාත්මක කරන මේ වැඩසටහන සම්බන්ධව අපි ස්තූතිය පුද කරන අතරම විශේෂයෙන්ම මේ කොට්ඨාශ මන්ත්‍රී කියන්නේ කවුද කියන එක ඔබතුමිය ලැයිස්තුගත කරන්න ඕන. අපි කොට්ඨාශයෙන් දිනපු මන්ත්‍රීවරුන් 10 ක් ඉන්නවා. එතකොට මේ කුණු කූඩ කොච්චරද දෙන්නේ කියන ප්‍රශ්නේ තියෙනවා. මන්ත්‍රීවරු 16 දෙනාටම ලැබෙනවා නම් අපිට එහි කිසිදු ගැටලුවක් නැහැ. කොට්ඨාශ මට්ටමින් දෙනකොට කොට්ඨාශ මන්ත්‍රී නොවන මන්ත්‍රීලාට කුමන ක්‍රමයකටද දෙන්නේ කියන ප්‍රශ්නේ තියෙනවා. එනිසා ඒ සම්බන්ධව ඔබතුමිය කඩිනම් සුදුසු පියවරක් ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ අනුව ගරු කොට්ඨාශ මන්ත්‍රීතුමන්ලට හිමි වන අයිතිය නැත්නම් ලේකම්තුමා කලින් ලියුම් සටහන් කරන කොට ගැසට් සම්බන්ධව ප්‍රකාශ කළා. ඒ ගැසට් එකේම කොට්ඨාශයට දිනපු මන්ත්‍රී කියලා 10 දෙනා නම්කරලා තියෙන කොට සමහර කොට්ඨාශ නොවන අයගෙන් බාධා එල්ල වෙනවා. එනිසා ඒ සම්බන්ධව කඩිනම් පියවරක් ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා. දේශපාලන මට්ටමේ ගැටලුවක් අපට නැහැ. තම තමන්ගේ දේශපාලනය කරගෙන යාමට නිදහස තියෙනවා. නමුත් සභාව යටතේ වන වැඩ පිළිවෙලවල් සම්බන්ධව අපට ගොඩක් ප්‍රශ්න තියෙනවා. එනිසා කොට්ඨාශ මන්ත්‍රීවරුන්ට හිමිවන ස්ථානය අපට ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා. කොට්ඨාශ මට්ටමින් නෙවෙයි නම් ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**

කොම්පෝස්ට් බදුන් සියළුම මන්ත්‍රීවරුන්හට ලබාදීම පිළිබඳව තමයි ලිපිය ඉදිරිපත් කරලා තියෙන්නේ. ඊළඟට මුදල් කමිටු හා අනෙකුත් කමිටු පිළිබඳ වාර්තා ඉදිරිපත් කරන්න.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

සෞඛ්‍ය උපකරණ මිළදී ගැනීම සදහා මිල ගණන් කැදවා තිබුණා. නමුත් ඒවා පිළිබඳව මුදල් කමිටු වාර්තාවේ සදහන් වෙලා නැහැනේ?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**

කැඳවූ මිල ගණන් අඩුවෙන් ලැබී ඇති බැවින් තවත් කාල සීමාවක් ලබාදීලා තියෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මට ගැටලුවක් තියෙනවා ගරු සභාපති තුමියනි. ඉදිරියේදී සංවර්ධන යෝජනා ගොඩක් එන නිසා හැම ග්‍රාම සේවා වසමකම ග්‍රාම සංවර්ධන කමිටුව, කෘෂි සංවර්ධන සම්බන්ධව කටයුතු කරන සමිතිය, පළාත් සභාව මගින් ක්‍රියාත්මක කරන ජනරජ සමිතිය වගේ සමිති ගොඩක් තියෙනවා. එනිසා හැම අදාල වසමේම තිබෙන සමිති සංවර්ධන කටයුතු වලට යොදවන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා. එක සමිතියකට සංවර්ධන යෝජනා ගොඩවෙන කොට ප්‍රශ්නයක් තියෙනවා. එක සමිතියකට 5%ක් යන එක ලියා පදිංචි කරලා තියෙන වසමට තමයි පාවිච්චි කරන්න පුළුවන්. අනෙක් වසමට ඒ සම්බන්ධව මොකුත් කරන්න බැහැ. එනිසා ඉදිරියේදී එන සංවර්ධන යෝජනා අදාල සමිතියෙන් බෙදිලා යන විදිහට දුන්නොත් හොදයි. ඒක අපිට ඉදිරියේදි යෝජනා කරන්න පුළුවන්. සමිතියකට පොදු කටයුතු සදහා අදාල ග්‍රාම සේවා වසම හෝ වත්තකට මේ සමිතිය මගින් ශ්‍රමදානයක් කරනවා නම් මේ සමිතියත් එක්ක එකතු වෙලා කරනවා නම් මේ සමිතියට යම් මුදලක් ලබා ගන්න පහසුකම් තියෙනවා. ඒ වගේ යෝජනා නැත්නම් උපදෙස් ලබා දෙන එක ප්‍රාදේශීය ලේකම්තුමිය හරහා හෝ ග්‍රාම සංවර්ධන නිලධාරි හරහා ලබා දුන්නොත් හොදයි කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
සමහර ග්‍රාම සංවර්ධන සමිති සමහර පුද්ගලයින් සිටින අවස්ථාවේ විධිමත්ව ක්‍රියාත්මක වෙනවා. ඔවුන් ඉවත් වුණාම වෙනත් ආකාරයකින් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා තමයි සමහර ග්‍රාම සංවර්ධන සමිති වලට නොදී සිටියේ. ඉදිරියේදී හැමෝටම ලබා දෙමු.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
ශ්‍රී පාද වන්දනා සමයේදී වාහන ගාල් කිරීමේ ආදායම, ආදායම් වාර්තාවේ වෙනම සදහන් කරන්න. වැය වාර්තාවේ එක් එක් කරුණක් සදහා කාර්යාලයේ නිලධාරීන්ගේ නම් සදහන් වෙනනවා. එසේ නොමැතිව එකී වෙළද ස්ථානයේ නම සදහන් කරන්න.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
සාමිමලේ ජලය බෙදා දීමේ ව්‍යාපෘතියට සියළුම වැය වාර්තාවල වැය කිරීම් සදහන් වෙනවා. පසුගිය සභා වාර දෙකේදීම මම මේ පිළිබඳව යෝජනා ඉදිරිපත් කරලා තිබුණා. මෙම ජල ව්‍යාපෘතියේ ඇති සත්‍ය අඩුපාඩු පිළිබඳව සොයා බලා ඒ සදහා වූ මුදලක් වෙන් කර මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිම කර දිය යුතුයි. සත්‍ය අඩුපාඩු හදුනාගෙන ඒ සදහා විකල්ප මාර්ගවලට යා යුතුයි. නැතිනම් සියලුම වැය වාර්තාවල මෙම කාරණාව දිගටම සදහන් වේවි. එහි සිටින සෞඛ්‍ය පරික්ෂකවරයා මේ සදහාද තියාගෙන ඉන්නේ කියන එක දන්නේ නැහැ. මේ සදහා සුදුසු කටයුත්තක් සිදු කළ යුතුයි. මෙම ජල ව්‍යාපෘතියේ ඇති අඩුපාඩු දැනගැනිම සදහා මන්ත්‍රීවරුන්ද සම්බන්ධ කර ගනිමින් කමිටුවක් පත් කරන්න. නැතිනම් සියලුම මාසවල ඒ සදහා යම් කිසි මුදලක් වැය කිරිමට සිදු වේවි.

**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**
සෑම මසකම සාමිමලේ ජල ව්‍යාපෘතියේ විශාල ගැටළුවක් මතු වෙනවා. නගරයේ පිහිටි කඩවල් වලින් කිරිපිටි දුන්නේ නැත්නම් එම ප්‍රදේශයේ වතු දෙකක ජනතාව එහි පිහිටි ජලනල වලට විශාල හානියක් සිදු කරනවා. පසුගිය අවස්ථාවක "සජ්පානි" යන අය මගින් රුපියල් 13000.00 ක් වටිනා ජල නලයක් හැටන්වල සිට ගෙන්වා දුන්නා. පසුගිය මාසයේ දින පහක්ම වතුර තිබුණේ නැහැ. හැටන්වල සිට බවුසරයක් මගින් වතුර ගෙනල්ලා දෙන්න සිදුවුණා. වතු දෙකක ජනතාව ගමන් කරන්නේ ඒ මාර්ගය ඔස්සේ. ඔවුන්ට යම් ප්‍රශ්නයක් මතු වුවහොත්, එම ප්‍රදේශයේ තියෙන ජල නලවලට තමයි හානි කරන්නේ. මේ පිළිබඳව පොලිස් ස්ථානයටත් පැමිණිලි කරලා තියෙනවා. නැතිනම් ජල සම්පාදන මණ්ඩලය වෙත මෙම කාර්යය භාර දීම පිළිබඳව උපදෙස් ලබා දීලා තියෙනවා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කිරිම සදහා රුපියල් ලක්ෂ පනහකට වැඩිය වැය වෙනවා. එනිසා ඇස්තමේන්තු කරලා අවශ්‍ය තැන්වලට යවලා තියෙනවා. කඩන්න බැරි ජලනල ටික තමයි කඩලා තියෙන්නේ. දැන් දාලා තියෙන ජලනල ටික කවදා කඩයිද කියලා දන්නේ නැහැ. ජල සැපයුමට බාධා සිදු වන නිසා නගරයේ ඉන්න ජනතාව සමගත් ගැටලු මතු වෙනවා. ඒ නිසා තමයි යම් අඩුපාඩුවක් සිදුවන අවස්ථාවේ වහාම ඒවා අළුත්වැඩියා සිදු කළ යුතු අවශ්‍යතාවය මතු වෙන්නේ. පොලිසියටත් පැමිණිලි කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**
අභාවප්‍රාප්ත ගරු ආරුමුගන් තොණ්ඩමන් මැතිතුමා රුපියල් ලක්ෂ හැටක ප්‍රතිපාදන වෙන් කරලා එම ජල ව්‍යාපෘතිය ලබා දුන්නා. නගරයේ ඉන්න වෙළඳුන් සමග ඇති තරහ නිසා තමයි මෙහෙම සිදු කරන්නේ කියලා කතා වෙනවා. ඒ නිසා මේ සදහා ඉහල තලයෙන් අවශ්‍ය කටයුතු කරන ලෙස මෙම සභාවෙන් මා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී පී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)**
පසුගිය දින දෙකකට පෙර මම එහාට ගිහිල්ලා සිටියා. එහි ජලනල වලට යාබදව විකල්ප ක්‍රියාමාර්ගයක් සිදු කරන්න පුළුවන්. නගරයේ යම් භාණ්ඩ සගවාගෙන ජනතාවට නැහැ කියලා කියනවාලු. ඒ නිසා තරහට මෙම ජලනල ටික කඩනවා කියලා මටත් ආරංචි වුණා. දෙපාර්ශවයම කැඳවලා කතා කළොත් හොදයි කියලා හිතෙනවා.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
මුදල් කමිටු රැස්වීම පැවති දිනයේදී ගරු සභාපතිතුමිය හදිසියේ වෙනත් රැස්වීමකට යන නිසා ගරු මන්ත්‍රී දිසානායක මැතිතුමාට සභාපතිත්වය පවරලා ගිය බවට සුළු මොහොතකට පෙරදී මෙතන සදහන් වුණා. නමුත් මුදල් කමිටු වාර්තාවේ පැමිණි අය පිළිබඳ විස්තරවල සභාපතිතුමියගේ නම තියෙනවා. එය කොහොමද සිදුවෙන්නේ.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
වාර්තාවේ මෙම කාරණාවන් ඉතා පැහැදිලිව තියෙනවා. එදින රැස්වීම ආරම්භ කරන අවස්ථාවේ මම සිටියා. පසුව රැස්වීම අතරමැදදී මට වෙනත් රැස්වීමකට යාමට සිදුවූ නිසා ගරු මන්ත්‍රී දිසානායක මැතිතුමාව  මම තමයි කමිටුවේ සභාපති වශයෙන් පත් කරලා ගියේ.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් (එ.ජා.ප)**
එසේ නම් කුමන කාරණාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන අවස්ථාවේදීද ගරු සභාපතිතුමිය ගියේ කියලා වාර්තාවේ සදහන් වෙලා නැහැ. ගරු සභාපතිතුමිය නැති අවස්ථාවේදී යම් තීරණයක් ලබාගෙන ඒ සම්බන්ධයෙන් ගැටළුවක් මතු වුවහොත් මොකක්ද කරන්නේ? ඔබතුමිය පිටවෙලා ගිය වෙලාව හරි සදහන් වෙන්න ඕන නේද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
පෙරවරු 11.45 ට පමණ මම කමිටුවෙන් පිටවෙලා ගිය බවට වාර්තාවේ පැහැදිලිව සදහන් කර තිබෙනවා.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
සාමිමලේ ජල ව්‍යපෘතිය නඩත්තු කිරීම, අනෙකුත් සියලුදේ සිදු කිරීම, ගාස්තු අය කිරීම වැනි සියලුම දේවල් සිදු කරන්නේ මස්කෙළිය ප්‍රාදේශීය සභාවෙන් තමයි. ඒ නිසා එහි සිදුවිය යුතු පරිපාලන කටයුතු සිදු කරගෙන යාම අපගේ රාජකාරියක්. ගරු මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමාගේ ප්‍රශ්න කිරීමට අනුව ඔබතුමිය පෙ.ව 11.45 ට පමණ වෙනත් රැස්වීමකට ගිය බවට ඉතා පැහැදිලිව වාර්තාවේ සදහන් වෙනවා. නමුත් වාර්තාවේ සදහන් සියලු තීරණ ලබා ගැනීමේදී ගරු සභාපතිතුමිය සිටියාද? කියන කාරණාව පැහැදිලි නැහැ. ඔබතුමිය නැති අවස්ථාවලදී සභා කටයුතුවලට හෝ සභා සාරධර්මවලට එහා ගොස් යම්කිසි තීරණයක් ලබාගෙන තිබුණේ නම් ඒ අවස්ථාවේදී මොකද කරන්නේ? ඒ නිසා අනාගතයේදී ගරු සභාපතිතුමිය කමිටුවේ සිටින අවස්ථාවේදී ලබා

ගන්නා කරුණු සම්බන්ධ තීරණ වෙනමද?, නැති අවස්ථාවේදී සාකච්ඡා කල කරුණු වෙනමද සටහන් කරන්න.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**
මුදල් කමිටු වාර්තාව නිවැරැදි බවට මම යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රිනී කේ.පී.කුසුමාවතී පෙරේරා මැතිතුමිය (ලං.ක.කො)</u>**
එම යෝජනාව මම ස්ථිර කරමි.

## <u>2022.02.08 දින පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව</u>

**කාරණා අංක 01**
ZB – 0394 අංක දරණ කම්පැක්ටර් රථය සඳහා ටයර්, බැටරි ලබා ගැනීම හා සේවා කිරීම සඳහා ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 04**
ඉහත ලිපියට අනුව අදාල වාහනය තාක්ෂණ කමිටු සාමාජිකයන් විසින් පරීක්ෂාකර ලබාදුන් නිර්දේශය අනුව කම්පැක්ටර් රථයේ ටයර්, බැට්‍රි මිලදීගැනීම සඳහා මිලගණන් කැඳවීමට මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

**කාරණා අංක 02**
මස්කෙළිය ප්‍රාදේශීය සභාව මඟින් පොහොර කඩය පුළුල් කිරීම සඳහා කෘෂි කාර්මික උපකරණ, පැල වර්ග හා ඇට වර්ග මිලදී ගැනිම සම්බන්ධයෙන් කරුණු කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 05**
ඉහත කරුණට අදාලව මුදල් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදි.

**කාරණා අංක 03**
කාර්යාලය සඳහා බිත්ති ඔරලෝසු 02 ක් ලබා ගැනීම සඳහා අදාල ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලදි.

**තීරණ අංක 06**
ඉහත කරුණට අදාලව කාර්යාලයට බිත්ති ඔරලෝසු දෙකක් ලබාගැනිම සඳහා මුදල් කමිටුව නිර්දේශ කරන ලදී.

**කාරණා අංක 04**
RD – 1231 ට්‍රැක්ටර් රථයේ බැට්‍රිය මාරු කිරිම සඳහා අදාල ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදි.

**තීරණ අංක 07**
එම ට්‍රැක්ටර් රථයේ බැට්‍රිය මාරු කිරීම සඳහා තාක්ෂණ කමිටුවට මෙම කරුණ ඉදිරිපත් කිරිමට කමිටුව නිර්දේශ කරන ලදී.

**කාරණා අංක 05**
2022 වර්ෂය සඳහා මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුව, තාක්ෂණ කමිටුව, නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව, පරිසර හා සහසුකම් කමිටුව යන කමිටු සඳහා පත්කර ඇති ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රවාහන දීමනාව රු.500.00 කින් වැඩිකර දෙන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනිමට නිර්දේශය ලබා දෙන ලෙස කමිටුවට කරුණු ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 08**
ඉහත කරුණ මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

**කාරණා අංක 06**
ගරු මන්ත්‍රීවරුන්හට ලිපි ද්‍රව්‍ය ලබාදීම පිළිබඳව මුදල් කමිටුව විසින් සාකච්ඡා කරන ලදි.

**තීරණ අංක 09**
එම ලිපි ද්‍රව්‍ය ලබා දීමට කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

**කාරණා අංක 07**
විදුලි කාර්මික නිලධාරීන්ගේ ආරක්ෂිත ඇදුම් ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදි.

**තීරණ අංක 10**
එහි අවශ්‍යතාවය හදුනාගෙන එම ඇදුම් කට්ටල ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

**කාරණා අංක 08**
ගරු සභාපතිකුමියගේ හා ලේකම්තුමාගේ නිල කාමර සඳහා Calling Bell සවි කිරීම සඳහා මුදල් කමිටුව වෙත කරුණු ඉදිරිපත් කරන ලදි.

**තීරණ අංක 11**
ගරු සභාපතිකුමියගේ හා ලේකම්තුමාගේ නිල කාමර සඳහා Bell ලබා දීමට කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

**කාරණා අංක 09**
කාර්යාලය ඇතුලත CCTV කැමරා සවි කිරීම හා මිලදී ගැනීමට සාකච්ඡා කරන ලදි.

**තීරණ අංක 12**
CCTV කැමරා හතරක් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීමට කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඊළගට ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
නුවරඑළිය දිස්ත්‍රික්කයට ලැබී ඇති උප ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිළිබඳවයි මාගේ පළමු යෝජනාව වන්නේ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ සිදුවන කරුණු පිළිබඳව රූපවාහිනිය සහ ගුවන් විදුලිය මගින් අපට කරුණු දැනගන්න පුලුවන් වී තියෙනවා. හිටපු ජනාධිපති ගරු චන්ද්‍රිකා මැතිනියගේ කාලවකවානුව තුල සීමා නිර්ණය කමිටුව මගින් අභාවප්‍රාප්ත ගරු අමාත්‍ය සෞම්‍යමූර්ති තොණ්ඩමන් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අදහස් කිහිපයක්. නුවරඑළිය දිසිත්‍රික්කය සඳහා ග්‍රාම නිලධාරි කොට්ඨාශ කිහිපයක්, උප කාර්යාල කිහිපයක් පිහිටවිය යුතුයි. විවිධ කාර්යාල මෙම ප්‍රදේශයට ලබා දිය යුතුයි.
එම ආයතන ග්‍රාම නිලධාරී කොට්ඨාශය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිහිටා ඇති විවිධ රාජකාරී බහුලත්වය අඩු කර ගැනීමේ අරමුණින්, උප කාර්යාල වහාම ක්‍රියාත්මක කළ යුතුයි වැනි කරුණු ජනගහනය අනුව පිහිටවිය යුතුයි, වැනි කරුණු හැම දෙනාම ගරු චන්ද්‍රිකා මැතිනියගේ කාලයේදී ඉදිරිපත් කළා. නමුත් එම කාලයේ සිටම මෙම යෝජනා ප්‍රමාද බව පෙනුනා. 2012 වර්ෂයේදී දෙලක්ෂ තුන්දහස් නවසිය හැත්තෑ හයක ජනගහනයට අනුව උප ග්‍රාම නිලධාරී කාර්යාල  වශයෙන් කාර්යාල 67 ක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ වෙන් කරලා තියෙනවා. ජනගහනය අනුව මෙම කාර්යය ඉටු කරලා තියෙනවා. මේ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 41 සහ අංක 95 දරණ වගන්තිවල පළවෙනි උප වගන්තියට අනුව 2015.01.13 වෙනි දින මෙම විෂය සීමා නිර්ණය විධිමත් ලෙස  සිදු කල යුතුයි.
අදාල ස්ථානවලට විධිමත් සේවාවක් ලබා දිය යුතුයි, යනුවෙන් සීමා නිර්ණය කමිටුවෙන් යෝජනා ඉදිරිපත් කරනලදී. එකී කාලය තුල මධ්‍යම පළාත් සභාවේ හිටපු ගරු මන්ත්‍රී පිලිප් කුමාර් මැතිතුමා මගින් මෙම යෝජනාව ඉදිරිපත් කල අවස්ථාවේ මේ සඳහා හිටපු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ගරු රාධක්‍රිෂ්ණන් ඇමතිතුමාත් සහයෝගය පල කරමින් කැපවීමෙන් කටයුතු කලබව සඳහන් කල යුතුයි. මෙම යෝජනා දැනට උප කාර්යාල වශයෙන් ක්‍රියාත්මක වෙනවා. මෙම උප කාර්යාල මගින් කඳුරටට විධිමත් සේවාවක් ලබාදීම මගින් ඒවා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වශයෙන් පරිවර්තනය කිරීමට ද උපකාරී වේ. එනිසා මෙහි ස්ථාපිත කල උප කාර්යාල විධිමත්ව ක්‍රියාත්මක කරමින් ජනතාවට සේවය ලබා දීම සඳහා කැපවීමෙන් කටයුතු කල යුතු බවට  මා මෙහි සඳහන් කිරිමට කැමැත්තෙමි.
වත්මන් ගරු රාජ්‍ය අමාත්‍ය ජීවන් තොන්ඩමන් මැතිතුමාගේ අවධානයටත් මෙම කාරණාව ඉදිරිපත් කල අවස්ථාවේ ඉහත උප කාර්යාල විධිමත්ව ක්‍රියාත්මක වන අවස්ථාවේදී ම මෙතෙක් නොලැබී තිබු කාර්යාල ලබා දීමටත් තමන්ගේ පාලන කාලය තුල මෙම කාර්යාල ප්‍රාදේශීය කාර්යාල බවට පරිවර්තනයකර පෙන්වන බවටත් එතුමා පැවසුවා. කෙසේ වෙතත් රජය මගින් විවිධ ගැසට් නිවේදන නිකුත් කරමින් පවතිනවා.

පූර්ණ ප්‍රාදේශීය කාර්යාලයක් නොවුවද උප කාර්යාලයක්වත් ලබාදී ම සම්බන්ධයෙන් ගරු රාජ්‍ය අමාත්‍ය ජීවන් තොණ්ඩමන් මැතිතුමාටත් නුවරඑළිය අඹගමුව ප්‍රාදෙශීය සංවර්ධන කමිටු සභාපති වශයෙන් කටයුතු කරන ගරු රාමේෂ්වරන් මැතිතුමාටත් මාගේ ස්තූතිය පුදකරන අතර මේ කාරණාව සම්බන්ධයෙන් මෙහිදී ජනතාවට සම්පූර්ණ සේවාවක් ලැබිය යුතුයි. අනාගතයේදී මෙය සම්පූර්ණ ප්‍රාදේශීය කාර්යාලයක් බවට පරිවර්තනය කිරීමට අදාල අමාත්‍යාංශය වෙත සභාව මගින් ලිපියක් යොමු කරන ලෙසට ද ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

පසුගිය 07 වන දින නුවරඑළිය දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේදී මේ පිළබඳව සාකච්ඡා වුණා. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රාධක්‍රිෂ්ණන් මැතිතුමා මගින්ද, හිටපු මධ්‍යම පළාත් සභා මන්ත්‍රී ගරු පිලිප් කුමාර් මැතිතුමා මගින්ද මෙම යෝජනාව ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධයෙන් කමිටුවක් පත්කරන බවටත් සදහන් වුණා. අපිත් මේ පිළිබඳව ලිපියක් යොමු කරමු.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

දැනට කතාබහට ලක්ව ඇති කරුණු සහ ලැබුණ දේවල් පිළිබඳව සාධාරණීකරණය කරමින් එය අනාගතයේදී සාධාරණව ලැබිය යුතුයි කියමින් ගරු මන්ත්‍රීතුමා කතා කල එක මම පිළිගත්තත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය ක්‍රියාත්මක කිරීම මේ රටේ එක්තරා නීතියක් ලෙස අපි බලනවා. එම නීතිය නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාවට පමණක් නුසුදුසුයිද යන ප්‍රශ්නාර්ථයක් මතු කරනවා. හේතුව 1992 වසරේ අංක 58 දරණ බලය පැවරීම, ප්‍රාදේශීය ලේකම් නීතියේ 02 වන වගන්තිය යටතේ කියවෙන කරුණු වශයෙන් දක්වා 2019.10.23 වන දින එවකට ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනය මම සභාගත කරනවා. හිටපු පළාත් පාලන සහ පළාත් සභා කටයුතු පිළිබඳ අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනලද අමාත්‍ය මණ්ඩල සංදේශය ගැසට් නිවේදනයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට පෙර එතුමා නියෝජනය කරන ලද ගාල්ල දිස්ත්‍රික්කයට අතිරේකව ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක් අවශ්‍ය බවට ගැසට් නිවේදය කළා.

මෙම ගැසට් නිවේදනය ගාල්ල දිස්ත්‍රික්කයේ ජීවත් වන සහෝදර ජනතාවට පක්ෂවත්, නුවරඑළිය දිස්ත්‍රික්ක වතුකරයේ ජීවත්වන ජනතාව නිසා දෙවන මට්ටමේ උප ප්‍රාදේශීය ලෙක්ම් කාර්යාල යනුවෙනුත් ස්ථාපිත කරලා තියෙනවා. ඇත්තටම ලැජ්ජා විය යුතු දෙයක්. ඒ ඒ කාල වකවානුවතුල සිටින අමාත්‍යවරුන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ විධායක නිලධාරීන් තමන්ගේ බලය තුලද ගැටී මෙය උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් බවට ලබාගෙන තිබීම ගැටළුවක් සහ අනීතික දෙයක් ලෙසයි අපි බලන්නේ. ඒ අනුව තමයි විවිධ සංවිධාන සහ මානව හිමිකම් සංවිධානය වෙත පැමිණිලි කරලා තියෙන්නේ. මෙය ක්‍රියත්මක කිරීමේ බලය පැවරිලා තියෙන්නේ දිස්ත්‍රික් ලේකම්ටයි. දිස්ත්‍රික් ලේකම්තුමාව අපි හමුවී සාකච්ඡා කල අවස්ථාවේදී එතුමා පැවසුවේ රජය විසින් චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව සහ කිසිම හේතුවක් මත පිහිටුවා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 336 න්

එකක්වත් වැඩි නොකළ යුතු බවටත් එහි සඳහන් බවටයි. ගාල්ලට අලුතෙන් පිහිටුවන්න පුළුවන්. අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 67 ක් තියෙනවා. ඒ යටතේ පවුල් කීයක් ජීවත් වෙනවද කියලා බලමු. මෙහි ජීවත්වෙන පවුල් 300 කට එක ග්‍රාම නිලධාරී වසමක් තියෙනවා. හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ එහි පවුල් 128 කට එක ග්‍රාම නිලධාරී වසමක් තියෙනවා. එදාම ග්‍රාම සේවා වසම් වැඩි කිරීම පිළිබඳව සීමා නිර්ණය කමිටුව නිර්දේශයක් ඉදිරිපත් කරඇති බවද ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීමේදී ඉදිරිපත් කල අවස්ථාවේ, සාමිමලේ ඕල්ටන් ග්‍රාම නිලධාරී කොට්ඨාශය පමණයි කොටස් දෙකකට කැඩුණේ. ඇයි මේ පිළිබඳව අපගේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නිහඬව ඉන්නේ කියලා දන්නේ නැහැ. සාමිමලේ ඕල්ටන් ග්‍රාම නිලධාරී වසමේ ජීවත්වන ජනගහණය වගේම ස්ට්‍රැස්පි ග්‍රාම සේවා වසමේත් ඉන්නවා. නමුත් ස්ට්‍රැස්පි, ගවරවිල යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ දෙකම කොටස් දෙකකට වෙන් කරලා නැහැ. ප්‍රාදේශීය සංවර්ධන කමිටුව සභාපතිතුමාගේ අවධානයට මෙම කරුණු අපි ඉදිරිපත් කළා. ඕල්ටන් සහ ස්ට්‍රැස්පි යන වසම් දෙක ඇතුලත් කරන ලෙසට එතුමා පවසලා තිබුණා. පවුල් 128 ක් ජීවත් වන හඟුරන්කෙත කොට්ඨාශයට එක ග්‍රාමසේවා වසමකුත්, පවුල් 8000 ක් ජීවත් වන ග්‍රාම සේවා වසම දෙකකට පමණක් වෙන් කළ හැකි බවට ප්‍රාදේශීය ලේකම් පවසනවා. පවුල් 128 කට ග්‍රාම සේවා වසමක් වෙන් කරන්න පුළුවන්. මෙහි පවුල් 4000 ක් ජීවත්වෙන ප්‍රදේශයකට එක ග්‍රාම සේවා කොට්ඨාශයක් වෙන් කිරීම ක්‍රියාත්මක වෙනවා. පවුල් 4000 ක් ජීවත්වෙන ප්‍රේද්ශයකට එක ග්‍රාම සේවා කොට්ඨාශයක් වැඩි කළ නොහැකි බවත් රජය පවසනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයට ලැබිය යුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට බාධා කිරීමේ චක්‍රලේඛයක් බවටයි අපි මෙය දකින්නේ. ගරු සභාපතිතුමියනි, ගාල්ල මන්ත්‍රීතුමා මෙම යෝජනාව ඉදිරිපත් කරමින් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්වත් ලැබීම පිළිබඳව සුබ පතනවා. එය එතුමාගේ රාජකාරියක්. අපි ඒක පිළිගන්නවා. නමුත් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ලැබිමට නියමිත සේවාවන් මොනවද කියන එක තමයි ප්‍රශ්නෙ තියෙන්නේ. උදාහරණයක් හැටියට සාමිමලේ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ උප කාර්යාලයක් ස්ථාපිත කළාම එහි ලේකම්තුමා ඉන්නවද? මෙහි තියෙන සියලුම පරිපාලන කටයුතු සිදු වේවිද කියන එකයි සැකය. යහපාලන රජය කාලයේ අවසාන මොහොතේ හරි මෙම සමාජයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් අවශ්‍ය බවට ගැසට් නිවේදනයක් නිකුත් කළා. එය දැන් ප්‍රශ්නාර්ථයක් බවට පත්කරලා. ගරු රාජ්‍ය අමාත්‍ය ජීවන් තොණ්ඩමන් මැතිතුමා වැරැද්දක් සිදුකළා, එහෙම නැත්නම් විපක්ෂයේ ඉන්න පාර්ලිමේන්තුව මන්ත්‍රීවරුන් වැරැද්දක් සිදුකළා කියලා අර්ථකථනය කරන්නේ නැහැ. මෙය සමස්ථයක් වශයෙන් අපගේ සමාජයට සිදු කළ අසාධාරණයක් බවටයි අපි දකින්නේ.

ගුවන් විදුලි වැඩසටහනකදී ගරු රාජ්‍ය අමාත්‍ය ජීවන් තොණ්ඩමන් මැතිතුමාගෙන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිළිබඳව ප්‍රශ්නකල අවස්ථාවේදී, ප්‍රදේශීය ලේකම් කාර්යාලයක් වශයෙනුයි ලැබෙන්න තිබුණේ, නමුත් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාල වශයෙන් වෙනස් කිරීමට කියන්න බැරි ප්‍රශ්නයක් තියෙනවා කියලා උත්තර දීලා තිබුණා. මස්කෙළිය ප්‍රාදේශීය සභාව දිහා බැලුවත් මෙහි ජාතීන් දෙකක් නියෝජනය කරමින් මන්ත්‍රීවරුන් සිටිනවා. මස්කෙළිය බල ප්‍රදේශය ගත්තත් දෙමළ, සිංහල, මුස්ලිම් යන ජන වර්ග ජීවත් වෙනවා. ගරු මන්ත්‍රීවරුන් වන එස්.සුරේෂ්කුමාර්, පි.රාජ්කුමාර් යන අය කිහිප වතාවක්ම සමෘද්ධි බැංකුව පිළිබඳව කතා කරලා තියෙනවා. එය සම්පූර්ණයෙන්ම සමෘද්ධි බැංකුවක් වශයෙන් ලැබුණු නිසා තමයි අපි දැන් සතුටු වෙන්නේ. එවැනි දෙයක් මෙහිදීත් සිදුවෙලා තිබුණා නම් අපි සතුටු වෙනවා. මෙය පෙර ප්‍රසිද්ධ කළ ගැසට් නිවේදනය ප්‍රශ්නයක් බවට පත් කර ඇති අවස්ථාවේ, පළාත් සභා සහ පළාත් පාලන

අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා මෙය ගැසට් නිවේදනයේ සදහන් කල පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් බවට පත් කිරීමට තමයි අපි කටයුතු කළ යුත්තේ. එහෙම නැතුව මෙය කුමන හෝ ක්‍රමයකින් පිළිගතහොත්, නැවතත් මෙම උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වශයෙන් වෙනස් කිරීමට තවත් ගැසට් නිවේදනයක් නිකුත් කර ගැනීමට කොච්චර කාලයක් ගනීද කියන එකේ ප්‍රශ්නයක් තියෙනවා. එනිසාම කාලීන අවස්ථාව අවශ්‍යතාවය ලෙස සලකාබලා මෙම කරුණු ක්‍රියාත්මක කළ යුතුයි. ග්‍රාම නිලධාරී කොට්ඨාශ තවත් වැඩි කරලා තිබුණා නම් සංවර්ධන කටයුතු සදහා රුපියල් මිලියන කීයක මුදලක් ලැබිලා ඇතිද? එතුමාගේ යෝජනාවට අනුව සුභ පැතුම් යොමු කරනවාත් සමගම එම යෝජනාවට අනුව මමත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරනවා. එම අදහස් පිළිබඳව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා අවශ්‍ය කටයුතු සිදු කළ යුතුයි. යම්කිසි ලිපි ගොනුවක් අපි උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට රැගෙන ගොස් එහි සිටින නිලධාරීන් එම ලිපි ගොනුව ගිනිගත්තේනට රැගෙන යනවාට වඩා ඍජුවම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යන්න පුළුවන්. එනිසා මෙම උප ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වශයෙන් වෙනස් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුයි. එබැවින් අදාල ස්ථානයට මෙම ගැසට් නිවේදනයත් අමුණා ලිපියක් යොමුකරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**

1979 වර්ෂයේ සාමිමලේ ප්‍රදේශයට එවකට පැවති රජය මගින් තැපැල් කාර්යාලයක් ලබා දුන්නා. නමුත් අද තැපැල් කාර්යාලය ඇත්තේ නැහැ. රු.5500.00 ක් රජයෙන් කුලී ගෙවපු ගොඩනැගිල්ල අද තනි පුද්ගලයෙකුට අයිති වෙලා තියෙනවා. එහි අවට පිහිටි පරිසරය කෝටි ගණන් වලට විකුණලා තියෙනවා. පන්සලට ඉදිරියෙන් පිහිටි ඉඩම පිළිබඳවත් සභාව ආරම්භකල කාලයේ සිට අපි කතා කරනවා. එම ඉඩම ඉඩම් ප්‍රතිශංස්කරණ කොමිෂන් සභාවට අයත් එකක්. එම ඉඩමත් බලෙන් අල්ලාගෙන. ඒ පිළිබඳවත් ලිපි යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිළිබඳව මාස 6 කට පෙර සියළුම ලේඛන ඉදිරිපත් කරමින් මම යෝජනාවක් ඉදිරිපත් කරලා තිබුණා. එම ලිපියට පිළිතුරු ලිපියක් ලැබුණාද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

නැහැ. මෙතෙක් ලැබුණේ නැහැ.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

ඊළඟට, ලැබී ඇති සමෘද්ධි බැංකුව පිළිබඳවූ යෝජනාව ඉදිරිපත් කරමි. මෙම සභාවට පැමිණි දවසේ ඉදන් අපි කියලා තියෙනවා. මෑතකදී මෙම සමෘද්ධි බැංකුව ලැබිලා තියෙනවා. සමෘද්ධි බැංකුව ලැබිලා තිබුණාට ශ්‍රී ලංකාවේ විගණන අංශය මගින් එම සමෘද්ධි බැංකුවට අදාල නියමිත බලතල ලබාදීලා නැහැ කියලා මට දැනගන්න ලැබුණා. ඒ නිසා ඒ සදහා වූ වැඩසටහනක් හදලා දෙනවා. ඉදිරියට මෙම සමෘද්ධි බැංකුව විධිමත්ව ක්‍රියාත්මක වෙන බවටත් ප්‍රකාශ කරමි. සමෘද්ධි ප්‍රතිලාභීන්ට අතිරේකව රුපියල් 1000.00 ක් ලබාදිය යුතු බවට ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් ගැසට්

නිවේදනයක් නිකුත්කරලා තියෙනවා. ඇත්තටම සමෘද්ධි ප්‍රතිලාභීන් කවුද කියලා තෝරා ගැනීම පිළිබඳව දිගටම අවධානය යොමුකල යුතුයි. රැකියාවක් නොමැති අය තමයි සමෘද්ධි ප්‍රතිලාභීන් හැටියට සිටිය යුත්තේ. එනිසා මේ පිළබඳව අදාල කළමණාකරුවන් දැනුවත් කළ යුතුයි. සමහර අවස්ථාවලදී බැංකු කටයුතු සිදුකරගෙන යාමට බාධාවක් වශයෙන් ජනතාවක් ඉන්නවා කියලා ප්‍රකාශ වෙලා තිබුණා. කමිටුවල සිටින අය කමිටුව මගින් මුදල් ලබාගෙන එය නැවත ගෙවීම ප්‍රතික්ෂේප කරන බවටත් සදහන් වෙනවා. මේවගේ දේවල් සිදුවෙනවා නම් අපි සියලු දෙනා එකතුවී මෙම බැංකුව ලබාගත් එකෙන් පලක් නැහැ. ජනතාව පැත්තෙන් මෙහි ගැටළුවක් තියෙනවා. එනිසා ඔබගෙන් ග්‍රාමීය මට්ටමෙන් මෙවැනි දේවල් සිදු නොවීමට වගබලා ගන්නා ලෙසද පැවසුවා. මෙවැනි දේවල් සියලුම දෙනාට ගැටළුවක් බවට පත්වෙනවා. එනිසා මේ කරුණ පිළිබඳව ඔබතුමිය මගින් කටයුතු කරන ලෙසට ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

සමෘද්ධි බැංකුව පිළිබඳවූ යෝජනාවක් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරලා තියෙනවා. මෙම සමෘද්ධි බැංකුව ලැබීම ඇත්තටම සතුටට කරුණක්. ඒ සදහා මාගේ ස්තූතිය පිරිනමනවා. මෙම සමෘද්ධි බැංකුව ලැබීම මගින් අප සමාජයේ සිටින උගත් අය කීදෙනෙක් පල ප්‍රයෝජන ලැබුවාද? විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් එහි පවතිනවා. මස්කෙළිය ප්‍රදේශයේ ජීවත්වන සමෘද්ධි නිලධාරියෙක් කැපවීමෙන් සේවය කරලා සම්මාන 12 ක් හිමිකරගත් කෙනෙකුට ලැබීමට නියමිතව තිබූ කළමණාකරු පත්වීමට බාධා කරලා වෙනත් ප්‍රාදේශීය සභාවක් යටතේ සිටි කෙනෙක්ව කළමණාකරු තනතුරට පත්කිරීමේ ආඩම්බරයක් මෙම ප්‍රදේශයේ දේශපාලනයට උරුම වෙනවා.

උගත් උපාධිධාරීන් බොහෝ දෙනෙක් අපේ සමාජයේ ඉන්නවා. අපේ ප්‍රදේශයට ලැබෙන මෙවැනි අවස්ථා අපි වෙනත් අයට භාර කරනවා. මෙයින් දේශපාලන පසුබෑමක් දකින්න තියෙනවා. අනාගතයේදී මෙවැනි දේවල් සිදු නොවීමට වගබලා ගනිමින් අපේ ප්‍රදේශයේ සියලු දෙනාට ඔවුන්ගේ සුදුසුකම් මත අපි සියලු දෙනා එක්වී ඔවුන්ට අවශ්‍ය රැකියාව ලබාදිය යුතුයි. මස්කෙළිය ප්‍රාදේශීය සභාව ආරම්භ කරලා අවුරුදු 4 ක් සම්පූර්ණ වෙනවා. මෙම කාලය තුල කීදෙනෙකුට ස්ථිර රැකියාවක් ලබාදුන්නාද කියලා දන්නේ නැහැ. මහජන නියෝජිතයන් වශයෙන් සිටින අපි 16 දෙනා එකතුවෙලා අවම වශයෙන් අප ප්‍රදේශයේ සිටින දහ දෙනෙකුටවත් රජයේ රැකියා ලබාදිය යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

ගරු මන්ත්‍රීතුමා කියන විදිහට අපේ සභාවෙන් අහලා නෙවෙයි කළමණාකරුවන් පත්කළේ. ඒ අයට කියලා පරිපාලනයක් තියෙනවා. සමහර සමෘද්ධි නිලධාරීන් දේශපාලන වශයෙන් කටයුතු කිරීම පිළිබඳ අපට කිසිවක් කරන්න බැහැ. ඔහුට පාක්ෂිකව කටයුතු කරනවානම් මුද්දර කාඩ්පත ලබා දෙනවා. නැතිනම් මුද්දර කාඩ්පත ලබා දෙන්නේ නැහැ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මුදුදර ලබා ගැනිම සදහා පුද්ගලයින් තෝරා ගන්නේ සමෘද්ධි නිලධාරියා නෙවෙයි. ඔහුව අත හරිමු. ඔහු නැතිව අප ප්‍රදේශයේ වෙනත් සමෘද්ධි නිලධාරීන් ඉන්නවා නේද? ඔවුනට කළමණාකරු තනතුර ලබාදෙන්න තිබුණා නේද?

**<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)</u>**
සීතගඟුල සහ මරේ කොට්ඨාශ වලටත් පසුගිය කාලයේ සමෘද්ධි නිලධාරීන් දෙදෙනෙක් සිටියා. රිකාටන්, නල්ලතන්නිය, තෙබර්ටන් වැනි ප්‍රදේශ වලටත් සමෘද්ධි නිලධාරි කෙනෙක් සිටියා. දැන් එතුමත් ස්ථාන මාරුවක් ලබාගෙන ගිහිල්ලා. දැන් ප්‍රදේශ තුනකටම එකම එක සමෘද්ධි නිලධාරිවරයෙක් පමණයි ඉන්නේ. පවුල් 2500 යි. 550 ක් ප්‍රතිලාභීන් ඉන්නවා. එනිසා සමෘද්ධි කාර්යාලය සමග සම්බන්ධ වී සමෘද්ධි නිලධාරි වරයෙක් ලබා දෙන්නේ නම් වඩාත් හොදයි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
සමෘද්ධි පරිපාලන නිලධාරීන් පිළිබඳ ගැටළුවට අපට මොනවත් කරන් බැහැ. කෙසේ වෙතත් සුදුසුකම් තියෙන අය ඉන්නවානම් ඒ අයට එම තනතුරු ලැබෙන්න ඕන. ඒ විදිහට තනතුරු ලබා ගන්නවා නම් වඩාත් හොදයි. ඊළඟට නල්ලතන්නියේ ඇති රථගාල පිළිබඳ යෝජනාව ඉදිරිපත් කිරීමට අදහස් කරමි. මරේ, වාලමලේ වැනි ප්‍රදේශ වලට අදාල වෑන් රථ 15 ක් තියෙනවා. එම වෑන් රථ ගාල් කිරීම පිළිබඳ ගැටළුව ගරු සභාපතිතුමිය වෙත මීට පෙර ඉදිරිපත් කරලා තියෙනවා. මේ පිළිබඳ අභාවප්‍රාප්ත හිටපු අමාත්‍ය ගරු ආරුමුගන් තොණ්ඩමන් මැතිතුමාගේ අවධානයට යොමු කළා. ඒ අවස්ථාවේ මේ පිළිබඳව ඔබතුමියගේ අවධානයට යොමුකර නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්තුමා වෙත දැනුම් දී විධිමත් කටයුතු කරන ලෙසද උපදෙස් ලබාදී තිබුණා. ඒ නිසා දැනට මේ පිළිබඳව ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ගරු සභාපතිතුමියගේ පැහැදිලි කිරීමක් මා බලාපොරොත්තු වෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මේ කාරණාව පිළිබඳව එම තරුණයන් ගරු අමාත්‍ය ආරුමුගන් තොන්ඩමන් මැතිතුමාව හමු වූ අවස්ථාවේදී හිටපු නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලාමේන්තු මන්ත්‍රී ගරු ජෙගදීස්වරන් මැතිතුමා වෙත යොමුකර ඒ අයට වාහන පහක් ගාල් කාරීමට අවශ්‍ය බිම් කොටසක් වෙන් කරලා දීලා තිබුණා. එම ස්ථානය ආරක්ෂාකර ගැනීම ඒ අයගේ වගකීමක්. එය කර ගැනීමට ඒ අය අපොහොසත් වුණා. අපි බලමු.

**<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)</u>**
එම ස්ථානයේ වාහන ගාල් කරලා තැබුවාම එක එක්කෙනා එතැන වාහන නවත්තනවා. ඒ අයගේ වෙළදාමට බාධා ඇති වෙනවා. පදිකයින්ට ගමන් කිරීමට ඉඩ නැති බවට හේතු තියෙනවා. මේ නිසා කිසිම තැනක වාහන නවතා තැබීමට නොහැකි තත්වයක් තියෙනවා. එනිසා ගරු සභාපතිතුමියනි මේ සදහා සුදුසු තීරණයක් ලබා දෙන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඔබවත් සම්බන්ධ කරගෙන තමයි හොද තීරණයක් ලබා දුන්නේ. තනි පුද්ගලයෙක් එම ස්ථානයට අයිතිවාසිකම් කියනවා නම් වාහන රියදුරන් කතා කරන්න ඕන නේද? ඒක ඔහුට අයිති ඉඩමක් නෙවෙයි නේද? අභාවප්‍රාප්ත ගරු අමාත්‍ය ආරුමුගන් තොණ්ඩමන් මැතිතුමයි වත්මන් රාජ්‍ය අමාත්‍ය ජීවන් මැතිතුමයි ඇවිල්ලා එම ස්ථානය බලලා තමයි ලබාදිය යුතු ඉඩම ලබා දුන්නේ. ඒක ආරක්ෂා කරගැනීම ඒ අයගේ වගකීමක්.

**ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)**
වෙනත් ස්ථානයක් හෝ දැනට ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
ඊයේ දිනයේදී මමයි ලේකම්තුමයි පරීක්ෂණ නිලධාරී සමග සාකච්ඡා කළා. ශ්‍රී පාදස්ථානයේ කසළ කළමණාකරනය කිරීමට පමණක් අපට බලය ඇති බව ඔහු පැවසුවා. මෙම රථගාල පිළිබඳව අවුරුදු 5 ක් 6 ක් තිස්සේ අපි කතා කරනවා. එහි සිටින සියලුම රියදුරන් අපගේ ප්‍රදේශයේ තමයි. ඇයි අපට එම ප්‍රදේශයේ වාහන 5 ක් නවතා තැබීම සදහා නාම පුවරුවක් සවිකළ නොහැක්කේ. ඒ වගේම තමයි ත්‍රීරෝද රථ රියදුරනුත් ඉන්නවා. ඒ අයගේ ජීවනෝපාය මාර්ගය සදහා මොකක්ද කරන්නේ.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
මේ කාරණාව පිළබඳව අපි බලමු.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
මස්කෙළිය නගරයේ පිහිටි රථගාල පිළිබඳව සියලුම බලතල තියෙනවා. නමුත් මේ පිළිබඳව අපි කතා කරලා තියෙනවද? ඒ ප්‍රශ්නය මස්කෙළියේ තියෙනවා. රථගාල් වල ඉන්න අය තමන්ව ලියාපදිංචි කර දෙනලෙසට ඉල්ලා සිටිනවා. සභාව ආරම්භ කළ කාලයේ සිට අපි වාහන කීයක් ලියාපදිංචි කරලා තියෙනවද? නල්ලතන්නියේ රථගාල සම්බන්ධයෙන් සියලුම දෙනා ගිහින් ඒ ස්ථානය මැනලා භාරදීලා ආවා. නමුත් පසුදා දිනය වනවිට එම ස්ථානය පුද්ගලයෙක් විසින් අත්පත් කරගනු ලැබුවා. ඒ සදහා අපේ කාර්යාලයේ නිලධාරීන් කටයුතු කරලා තියෙනවද? පළමුව මස්කෙළිය නගරයේ පිහිටි රථගාල ආරක්ෂා කරන්න. වාහන සියල්ල ලියාපදිංචි කර සභාවට ලැබියයුතු ආදායම ලබාගන්න.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
අභාවප්‍රාප්ත ගරු ආරුමුගන් තොණ්ඩමන් මැතිතුමාගේ කාලයේ හිටපු සභාපති නගුලේෂවරන් මැතිතුමා සම්බන්ධ වෙමින් මෙම ස්ථානය වෙන්කරලා දුන්නා. අපි මේ සභාවෙන් ඒක නැති කර ගත්තා. සාමාන්‍යයෙන් හිටපු වාහන රියදුරන් තමයි ඉන්නේ. මේ දක්වා කිසිම ලියාපදිංචියක් නැහැනේ. ත්‍රීරෝද රථ ලියාපදිංචියෙත් ගැටළු තියෙනවා. එදා පැවති ක්‍රිකට් තරගයේදීත් මේ නිසා ප්‍රශ්න මතුවුණා. 15 දෙනෙක්ව අලුතෙන් නම් කරලා පසුව ඒ අයව අවලංගු කරන බවට පැවසුවා. නමුත් ඉන් 10 දෙනෙක් දැනටත් මෙම රථගාලේ ත්‍රීරෝද රථ නවත්තලා තියෙනවා. ඒවගේ ඒවා අවලංගු කරලා තිබුණා නම් අවලංගු කළ බවට සාක්ෂි කෝ? ලිපි යොමු කළාද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
සභාවෙන් නැවතත් තීරණයක් ලබාගෙන ඊට පෙර අලුතෙන් සම්බන්ධ කරගත් ත්‍රීරෝද රථවල ලියාපදිංචිය අවලංගු කරන ලෙසට පවසලා තිබුණා. අවසාන වර්ෂයේ ලදුපත් කඩලා නැහැ.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
ඒ අයගේ ත්‍රී රෝද රථ ලියාපදිංචිය අවලංගු කර ලිපි යොමු කළ යුතුයි. එතකොට නේද ඒ අයට දැනගන්න පුළුවන්. 15 දෙනෙකුට රු.50000.00 බැගින් රු 750000.00 ක් සභාවට ලබාගෙන තියෙනවා. මෙක පිළිගන්නවා නම් ලිපි යවන්න එපා. පිළගන්නේ නැත්තම් ලිපි යවන්න.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

සභා වාර තුනකදී දිගටම ත්‍රීරෝද රථ පිළිබඳව තමයි කතා කරලා තියෙන්නේ. පසුව තමයි ඒවා අවලංගු කරන ලෙසට පැවසුවේ. ඒ වගේ රු.50000.00 ක් කවුරුහරි ලබාගෙන තිබුණානම් අල්ලස් හා දූෂණ අංශයට යොමු කරන්න කියන්න.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

පළමුව එම ත්‍රීරෝද රථ ටික අවලංගු කරන ලෙසට ලිපියක් පමණක් යොමු කරන්න. එවිට සියලු කරුණු ඉබේම මතුවේවි. ඉන්පසුව මම ඉදිරිපත් වෙලා තොරතුරු ලබා දෙන්නම්. ලොරි රථගාලේ ද ගැටළු තියෙනවා. ත්‍රීරෝද රථගාල් වල තියෙන ත්‍රීරෝද රථ වල ප්‍රමාණය සදහන් කරලා නාම පුවරු සවි කරන ලෙසට අපි ඉල්ලා සිටියා. ඒකත් සිදු කලේ නැහැ. තාමත් තියෙන්නේ අඹගමුව ප්‍රාදේශීය  සභාවේ නාම පුවරු ටික.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

නැහැ, වෙනස් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

වාහන රථගාල් සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට ගරු සභාපතිතුමියගෙන් ඉල්ලා සිටිමි. නල්ලතන්නියේ පිහිටි රථගාල් පිළිබඳවද තීරණයකට එන්න.

**ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)**

ගරු සභාපතිතුමියනි, ඇත්ත වශයෙන්ම කියනවානම් මම අවුරුදු 20 ක් මස්කෙළිය වාහන නැවතුම්පලේ රියදුරෙක් වශයනේ කටයුතු කරලා තියෙනවා. කළින් තිබුණ අඹගමුව සභාව මස්කෙළිය ප්‍රාදේශීය සභාවට ආවට පස්සේ වෑන්, ලොරි රථගාල් ලියාපදිංචි වෙලා නැහැ, ආදායම් නැහැ, ආදායම් නැහැ කියලා අපි සභාවේ හැමදාම කියනවා. නමුත් ආදායම් ගන්න පුළුවන් තැන්වලින් අපි ආදායම් ගන්නේ නැහැ. ඒ දවස්වල වාහන 16, 18, 20 අතර තිබ්බේ. දැන් වාහන 30 ක 35 ක් ඇවිත් තියෙනවා. එතකොට එහි රියදුරෙක් වශයෙන් හයර් දුවලා ජීවනෝපාය ගෙනගිය මිනිසුන්ට ආදායම් මාර්ග අහිමි වෙලා තියෙනවා. සියලුම වාහන එතැනට ගෙනත් දානවා. එහි පාලනයක් නැහැ, ලියාපදිංචියක් නැහැ. එනිසා ශ්‍රී පාද සමයේදී නල්ලතන්නියේ ඉන්න රියදුරෝ ටික නල්ලතන්නියේ ගිහිල්ලා දුවනවා. එහෙම දුවද්දී තමයි ප්‍රශ්න ඇතිවෙන්නේ. ඊට පස්සේ එහේ මාස හය ඉවර වුණාට පස්සෙ කෙළින්ම මස්කෙළියට එනවා. ඊට පස්සෙ මස්කෙළියේ ගැටළුවක් ඇතිවෙනවා. එනිසා විධිමත් ක්‍රමයකින් ඒ අවට ඉන්න රියදුරන්ට එතැන අවසර ලබාදෙන්න. මේ අවට ඉන්න රියදුරන්ට මේක නීත්‍යානුකූලව ලියාපදිංචි කරලා ලබා දුන්නොත් ඒ ගැටළුවලින් විසදුමකට යන්න පුළුවන්. අපි කතා කරනවා විතරයි. වැඩ නෑ. වැඩ නැති නිසා තමයි ප්‍රශ්න හැම තැනම මතු වෙන්නෙ. ඒ අදාල විෂයභාර නිලධාරියෝ ගෙනැල්ලා ඒ කටයුතු ඇයි කරන්නැත්තෙ කියන එක බලන්න. හැමදාම ගිහින් වාහන රථගාල් බලන්න. අලුතින් වාහන ඇවිද්ද කියලා බලන්න. මේ ආදායම් මාර්ග නැති වෙන්නේ අපි හින්දා. අවුරුදු 5 ක් විතර ලියාපදිංචි ගාස්තු සභාවට අහිමිවෙලා තියෙනවා. දැන් කෙළින්ම ලියාපදිංචි වෙලා අවුරුදු 5 ක් ඔබලා ලියාපදිංචි ගාස්තු ගෙවලා නැහැ. දැන් එකපාරට ඒ මුදල් ගෙවන්න කිවුවොත් ඒක කරන්න බැහැ. එනිසා සාධාරණයයකට ගිහින් එම කටයුතු කරන්න කියන්න.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මධ්‍යම පළාත් සභාවේ ලබාදෙන ලද ගුරු පත්වීම් පිළිබඳව ගැටළු කිහිපයක් තියෙනවා. ගුරුවරයෙකු අපහසුතාවයට පත්වන්නේ නම් එහි බලපෑම පංති කාමරයේ සිටින සිසු ප්‍රජාවටම හානිකරදායකයි. රු.10000.00 ක වැටුපකට ගුරුවරුන් ඉන්නවා. අවුරුදු 5 ක 6 ක් එකදිගටම එහෙමම සේවය කරනවා. මධ්‍යම පළාතේ පමණයි මෙම ගැටළුව පවතින්නේ. මෑතකදී සියලුම රාජ්‍ය සේවකයින්ට රුපියල් 5000.00 ක දීමනාවක් ලබා දුන්නා. ඒ රුපියල් 5000.00 දීමනාව පවා මේ ගුරුවරුන්ට ලැබුණේ නැහැ. එනිසා මෙම ගුරුවරුන්ගේ ප්‍රශ්න ගැටළුව වහාම නිරාකරණය කිරීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින අතර මෙම කාර්ය අපි මගින් ඉටුකරන්න බැහැ. නමුත් මේ පිළිබඳව මා ගරු රාජ්‍ය අමාත්‍යතුමා වෙත කතාකර ඉල්ලා සිටි අවස්ථාවේ මේ සඳහා අවශ්‍ය කටයුතු කරන බවට එතුමා පැවසුවා. මේ පිළිබඳව මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමාට බලපෑමක් සිදුකල හොත් මේ පිළිබඳව ක්‍රියාත්මක වේවි. අප ප්‍රදේශයේ 120 දෙනෙකුද මෙයට සම්බන්ධ වෙනවා. මධ්‍යම පළාතේම 346 ක් ඉන්නවා. මෙම අයගේ ශ්‍රේණි උසස් කිරීම අනිවාර්යයෙන් සිදු කළ යුතුයි. ඒ සඳහා සභාව මගින් අවශ්‍ය ලිපි යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව කමිටුවක් පත්කර ක්‍රියාත්මක වෙමින් සිටිනවා. කඩිනමින් මේ පිළිබඳව කටයුතු කරනවා. ඊළඟට ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙතෙක් වෙලා මා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා පිළබඳවයි සභාවේ සාකච්ඡා කළේ. මේ වතාවේ ඇයි මෙහෙම සිදුවුණේ කියලා දන්නේ නැහැ. මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කල යෝජනාවක් තවත් මන්ත්‍රීවරයෙකුට ඉදිරිපත් කරන්න පුළුවන්ද කියලා දන්නැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
දෙදෙනොගේ යෝජනාවල තිබුණ වචන සියල්ල වෙනස් වුණාට, එක්කෙනෙක්ගේ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුලත් කරලා අනෙත් කෙනාගේ යෝජනාව ඇතුලත් නොකළොත් එහි ගැටළුවක් වන නිසා යෝජනා දෙකම ඇතුලත් කළා.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා  (එ.ජා.ප)</u>**
දෙදෙනොගේම යෝජනාවල අදහස් බොහෝ දුරට එක විදිහටයි තියෙන්නේ. නමුත් කමක් නැහැ. දීර්ඝ කාලයක් තිස්සේ සභාවෙන් බලපෑම්කල නිසා තමයි එම සමෘද්ධි බැංකුව ලැබුණේ. මෙය සම්පූර්ණයෙන් බැංකුවක්ද එහෙම නැතිනම් උප කාර්යාලයක් වශයෙන් ස්ථාපිත කළාද කියලා දන්නේ නැහැ. මෑතකදී සමහර රාජකාරී සඳහා කිහිප දෙනෙක් මෙම බැංකුවට ගිහිල්ලා සිටියා. නමුත් ඒ අය සම්බන්ධ කරගත්තේ නෝර්වුඩ් එකේ පිහිටා ඇති බැංකුව තමයි. සමෘද්ධි බැංකුව මෙහි තියෙනවාද නැද්ද කියලා කතා කරන්න මම මෙහෙ ආවේ නැහැ. මෙම සමෘද්ධි බැංකුව මගින් ජනතාවට සිදුවන අසාධාරණකම් පිළිබඳවයි මම කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ. ජීවනෝපාය මාර්ගය අහිමි අයට තමන්ගේ ජීවිකාව අරන් යන්න සහන ලබාදීමටයි මෙම සමෘද්ධි බැංකුව තියෙන්නේ. නමුත් මෙහිදි සමෘද්ධි සහන ලබාගන්නා අයට පහසු ගෙවීමේ ක්‍රමයට භාණ්ඩ ලබා දෙනවා. තවත්  ණය පහසුකම් ලබා දෙනවා. මෙම ණය ගෙවීමට සමෘද්ධි සහන භාවිතා කරන්නේ. පොළී ප්‍රතිශතයත් වැඩියි. ක්ෂුද්‍ර ණය ක්‍රමයට වඩා බලවත් අසාධාරණ ලෙසට මෙම සමෘද්ධි නිලධාරීන් හැසිරෙනවා. ණය අයකර ගැනීම

සදහා ක්‍රමයක් තියෙනවා. නමුත් සමෘද්ධි බැංකුව විසින් ලබාදෙන ණය නැවත අයකර ගැනිම සදහා දැනුම්දීමක් ලබා දෙනවා. මෙම ලිපිය ලබා දෙන්නේ නීතීඥයෙකු මාර්ගයෙන්. ලිපිය යවන්නේ ලිපිය සකස් කිරීමේ ගාස්තුව වශයෙන් රු.500.00 ක් අදාල පුද්ගලයාගෙන් අයකරගෙනයි. ''ණය ආපසු ගෙවා අවසන් කරනතුරු මෙම ලිපිය නිවසේ දොරෙන් ඉවත්කර නොගත යුතුයි'' යනුවෙන් ලිපියේ පහළ කොටසේ සදහන් වෙනවා. සාමාන්‍ය ජනතාවට පමණයි මෙහෙම කරන්නේ. මෙය කෙතරම් ලැජ්ජා සහගත වැඩක්ද. මෑතකදී උතුරු නැගෙනහිර ප්‍රදේශයේ සමෘද්ධි නිලධාරියෙක්ව ගහලා මරලා තිබුණා. ඔහු ලිංගික අල්ලස් ඉල්ලා සිටි නිසයි එහෙම සිදු කරලා තියෙන්නේ.බොහෝ දුෂ්කරතා මැද්දෙන් තමයි මෙම ණය ගෙවන්නේ. මෙහෙම වැඩ කරනවානම් ඒ වගේ බැංකුවක් අවශ්‍ය නැහැ. මෑතකදී රජය විසින් ''ගම සමග පිළිසදර'' වැඩ සටහන යටතේ එක ගම්මානයකට රුපියල් ලක්ෂ තිහක ප්‍රතිපාදන වෙන් කළා. එහිදී නිවසේ කඩයක් සාදා ගැනිම සදහා කිහිප දෙනෙක්ගේ නම් යෝජනා වෙලා තිබුණා. එහිදී එක්තරා කාන්තාවක් ග්‍රාමීය කමිටුව මගින් තෝරාගත් බවටත් මෙම කඩය අවශ්‍ය නම් ''දිරිය මාතා'' නම් වැඩ සටහන යටතේ ඔබ රුපියල් 80000.00 ක් තැන්පත් කළයුතු බවටත් කියලා තියෙනවා. ඒ කාන්තාව රත්තරන් බඩු උකස් කරලා ඒ මුදල ගෙවලා තියෙනවා. අවසානයේදී ඒ කාන්තාවට එම කඩය ලැබිලා නැහැ. මේවා රජයේ අධීක්ෂණය යටතේ සිදුකළ යුතුයි. මෙම කාරණාව වහාම සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයි. සමෘද්ධි ණය ලබාගත් අයට වෙනත් ආයතන වල වගේ සහන ලබාදිය යුතුයි. ඊළගට උප කාර්යාලය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් බොහෝ අදහස් මොහෙතකට පෙර ඉදිරිපත් කරලා තිබුණා. උප ප්‍රාදේශීය කාර්යාල ලැබුණ නිසා සතුටු වියයුතු තැනක අපි නැහැ. නුවරඑළිය දිස්ත්‍රික්කය සදහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහක් ඉල්ලා සිටි අතර ඒවා ගැසට් නිවේදන මගිනුත් ප්‍රසිද්ධ කරලා තිබුණා. ඒවගේම ගාල්ලටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක් ඉල්ලා සිටි අතර ඒවාද එම ගැසට් නිවේදනයේම ප්‍රසිද්ධ කරලා තිබුණා. එම ප්‍රදේශයේ ඒවා ප්‍රාදේශීය ලේකම් කාර්යාල බවට ඉදිකරලා තියෙනවා. නමුත් නුවරඑළියේ උප ප්‍රාදේශීය ලේකම් කාර්යාල බවට ඉදිකරලා තියෙනවා.

මේ පිළිබඳව අපි කනගාටු වෙනවා. ලංකාවේ උද්ගත වී තිබූ යුද්ධය අවසන්කර ගැනීම සදහා ඉන්දු ලංකා ගිවිසුමට අනුව දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනයත් ක්‍රියාත්මක කරලා තිබුණා. දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව පළාත් සභා පරිපාලනය පහසුකර ගැනීමට ප්‍රාදේශීය සභා පිහිටුවනු ලැබුවා. ප්‍රාදේශීය සභාවට ශක්තියක් ලබාදීම සදහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටවනු ලැබුවා. 1987 ට පෙර ප්‍රාදේශීය සභා ක්‍රමයක් තිබුණේ නැහැ. ගම්සභා යන ක්‍රමයක් ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාත්මක වුණා. අතීතයේ කුඩා ප්‍රාදේශීය සභා වගේ තමයි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රියාත්මක වෙලා තිබුණේ. පසුව ක්‍රමවත්ව එක් එක් බලතල ලැබුණා. එම ගිවිසුම මගින් ජාතිවාද මට්ටමෙන් අප පීඩිත පන්තියක් බවට පත් කරලා තියෙනවා. වතු කම්කරුවන්ට සේවාව ලබාදීමේ ක්‍රමවේදයක් තුල ප්‍රාදේශීය සභාව නැහැ. මෙය අපට සිදු කල අසාධාරණයක්. දිගටම මේවගේ දේවල් පිළිගන්න බැහැ. එනිසා ගැසට් නිවේදනයේ ප්‍රසිද්ධ කළ පරිදි සම්පූර්ණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අපට අවශ්‍යයි. එනිසා මේ යෝජනාව සභාව පිළි අරගෙන රජය වෙත ඉදිරිපත් කළ යුතුයි. ඊළගට මාගේ අවසාන යෝජනාව. පසුගිය අයවැයේදී රජයේ සේවකයින්ට රු.5000.00 ක දීමනාවක් සහ වතු කම්කරුවන්ට කිලෝ 15 ක තිරිඟු පිටි ප්‍රමාණයක් ලබාදෙන බවට පැවසුවා. රජයේ සේවකයින් රටේ පුරවැසියෝ වෙනවා. ඒ වගේම වතු කම්කරුවනුත් රටේ පුරවැසියෝ වෙනවා. ක්‍රම දෙකකින් ජනතාව රැවටීමට පත්වෙලා ඉන්නවා. කිලෝ 15 ක තිරිඟු පිටි ලබාදෙන බවට පැවසුවා. නමුත් වතු කීයකට මේක ලබා දුන්නාද කියලා මම දන්නේ නැහැ. කඳුරට දේශපාලඥයින් නිශ්ශබ්දව ඉන්නේ ඇයි කියලා පැහැදිලි නැහැ. දැනට තිරිඟු පිටි හිඟයක් පවතිනවා. වතුකරයේ

ජනතාවට මේ වගේ බොරු පොරොන්දු ලබාදීලා පළිගැනීම නවත්තලා මේ අයත් රටේ පුරවැසියන් වශයෙන් රජයෙන් ලබාදෙන සහන සිල්ල විධිමත්ව ලබාදිය යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ගරු මන්ත්‍රීතුමා පැවසූ පරිදි තිරිඟු පිටි ලබාදීමේ සංවිධාන කටයුතු සිදුවෙමින් පවතිනවා. ලැබෙන්නෙ නැති වෙන්නේ නැහැ ලැබෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත්කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන් සහ අනෙකුත් යෝජනා සම්බන්ධයෙන් තීරණ ලබා ගත්තේ නැහැ. ලිපි යොමු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා ඉල්ලා සිටියා. එනිසා මේ කාරණාව සම්බන්ධව අදාල අමාත්‍යාංශය වෙත ලිපි යොමුකරන්න. එතුමා යෝජනා කළ කරුණු මා ස්ථිර කරනවා.

**තීරණ අංක 13**
මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් අදාල ස්ථාන වලට ලිපි යොමු කිරීමට තීරණය කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
සමෘද්ධි බැංකුව මගින් ජනතාව කවුරුහරි අපහසුතාවයට පත්වී තිබුණානම් ලිඛිතව එම කරුණු ඉදිරිපත් කළහොත් අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඊළඟට ගරු මන්ත්‍රී රාජ්කුමාර් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීම.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ග්ලැන්ටිල්ඩ් ප්‍රදේශයට අපගේ සභාව මගින් වැඩ සටහනක් ක්‍රියාත්මක කරනවාද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
නැහැ.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
නමුත් සභාවේ සේවකයින් එහි සේවාව සඳහා යොදවලා තියෙනවා. මම සාක්ෂි සහිතව ඉදිරිපත් කරන්නම්. මගේ යෝජනාව නම් මස්කෙළිය ප්‍රදේශයට හදිසි මරණ පරීක්ෂක වරයෙක් නොමැතිවීම විශාල ගැටළුවක් වෙලා තියෙනවා. කොවිඩ් ප්‍රශනයත් තියෙනවා. එනිසා අදාල අමාත්‍යාංශය වෙත වහාම හදිසි මරණ පරීක්ෂකවරයෙක් ලබාදෙන ලෙසට ලිපියක් යොමු කරන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඩීසයිඩ් ප්‍රදේශයේ පිහිටි වත්තක වතු වෛද්‍ය නිලධාරීවරයෙක් මේ සඳහා සුදුසු කෙනෙක් ඉන්නවා. ඔහුගේ තොරතුරු අවශ්‍ය ස්ථාන වලට යවලා තියෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මේ සදහා සුදුසුකම් තියෙන දෙදෙනෙක් ඉන්නවා. නිවසක 55, 65, 75 වැනි වයස්වල කවුරුහරි මරණයට පත්වුණාම මරණ පරීක්ෂණය සදහා මස්කෙළියට යවලා එහි අවශ්‍ය නිලධාරීන් නැති නිසා ග්ලැන්කර්න් වලට යවනවා. මේ නිසා අවසන් කටයුතු සිදුකිරීම ඉතාමත් ප්‍රමාද වෙනවා. මේ පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ලිපියක් යොමු කරන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මීට පෙර මේ පිළිබඳව මම කතාකළා. ඒ අය බැහැ කියලා කිව්වා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ජනතාව පව් නේද? වයසක අය මිය ගිහාම වතු වෛද්‍ය නිලධාරීගේ නිර්දේශය මත අවසන් කටයුතු සිදු කිරිමට ලිපි යොමු කරන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මස්කෙළියේ දී ඇන්ටිජන් පරික්ෂාවක් සිදු කරනවා නම් පහසු වේවි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මේ සමග අද දින මෙම සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහයෝගය ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මෙයින් සභාවේ වැඩ කටයුතු අවසන් කරමි.

ස්තූතියි.

ආයුබෝවන්.

සභාපති,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.

ලේකම්,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.